**අඩ්ඩාලචේනයි ප්‍රාදේශීය සභාව**
**අම්පාර දිස්ත්‍රික්කය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 25 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව හා විස්තරාත්මක කළමණාකරණ වාර්තාව 2019 මැයි 31 දින සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට අඩ්ඩාලචේනයි ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

#### (අ) ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සභාව සතු ඉඩම් තක්සේරු කර ගිණුම්වලට ගෙනවිත් නොතිබුණි. | ඉඩම්වල වටිනාකම ස්ථාවර වත්කම් වශයෙන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතු වේ. | 2017 වර්ෂයේදී සාතකාගාරයක් ඉදිකිරීම සඳහා මිලදී ගෙන තිබූ ඉඩමේ වටිනාකම රු. 2,000,000 ගිණුම්වලට ගෙනවිත් තිබුණද, ඊට පෙර කාලවලට අදාල ඉඩම් තක්සේරුකර 2019 වර්ෂය සඳහා පිළියෙල කරන මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කරන බව දැනුම් දෙමි. |
| (ii) | සභාව විසින් ප්‍රයෝජනයට ගනු ලබන ලොරි 03, යතුරුපැදියක්, JCB යන්ත්‍ර, බවුසර් සහ ට්‍රැක්ටර් 04 ක් තක්සේරු කර ගිණුම්වලට ගෙනවිත් නොතිබුණි. | සභාව විසින් ප්‍රයෝජනයට ගන්නා සියළුම මෝටර් වාහන අදාල කාලවලදී තක්සේරුකර එම වටිනාකම ස්ථාවර වත්කම් ලෙස පෙන්විය යුතු වේ. | වාහනවල වටිනාකම තක්සේරු කරන ලෙස 2015 වර්ෂයේ ඉල්ලන ලද අතර, 2017 වර්ෂයේ වාහන කීපයක් තක්සේරු කර දෙන ලදී. තවත් වාහන කීපයක් වටිනාකම තක්සේරු කර එවා නොතිබුණි. එම වටිනාකම මූල්‍ය ප්‍රකාශනවලට ඇතුලත් නොකරන ලදි. ලද විගස මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කරන බව දන්වා සිටිමි. |

| | | | |
|---|---|---|---|
| (iii) | සමාලෝචිත වර්ෂයේ සහ 2017 වර්ෂයේ පරිත්‍යාග වශයෙන් ලැබුණු පුස්තකාල පොත් 107 ක වටිනාකම තක්සේරු කර ගිණුම්වලට ගෙනවිත් නොතිබුණි. | අදාල කාලවලදි තක්සේරුකර වටිනාකම ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කළ යුතු වේ. | 2019 වර්ෂයට අදාල ගිණුම් පිළියෙල කිරීමේදී මූල්‍ය ප්‍රකාශනවලට ඇතුලත් කරන බව දැනුම් දෙමි. |
| (iv) | සභාව විසින් පවත්වාගෙන යනු ලබන ලේඛන අනුව සමාලෝචිත වර්ෂය අවසානය දක්වා සණ අපද්‍රව්‍ය සේවා හිඟ ගාස්තු රු. 2,877,310 ක් වූවද මූල්‍ය ප්‍රකාශනවල එය රු. 2,569,844 ක් ලෙස දක්වා තිබුණි. | හිඟ ගාස්තු ජංගම වත්කම් සහ වර්ෂයට අදාල ආදායම් අතිරික්තයට බලපාන බැවින් නිවැරදි හිඟ මුදල මූල්‍ය ප්‍රකාශනවල පෙන්විය යුතු වේ. | 2019 වර්ෂයට අදාල ගිණුම් පිළියෙල කිරීමේදී මූල්‍ය ප්‍රකාශවලට ඇතුලත් කරන බව දැනුම් දෙමි. |
| (v) | 2015 සිට 2017 වර්ෂය දක්වා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයේ නිර්දේශය අනුව සමාලෝචිත වර්ෂයේ විනාශකරන ලද පුස්තකාල පොත් 975 ක වටිනාකම සඳහා පොත්වල ගැලපීම් කර නොතිබුණි. | අදාල කාලය තුල ගැලපීම් කර වටිනාකම ගිණුම්වලින් කපා හැරිය යුතු වේ. | 2015 සහ 2017 වර්ෂවල භාණ්ඩ සමීක්ෂණයේදි විනාශ කරන ලද පොත්පත් 614 ක වටිනාකම තක්සේරුකර ලේඛන වලින් අඩුකර ගැලපීම් කිරීමට අවශ්‍ය කටයුතු කරන බව දැනුම් දෙමි. |

**(ආ) ලිඛිත සාක්ෂි නොමැතිවීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ඉඩම් ඔප්පු, ස්ථාවර වත්කම් ලේඛන, සමීක්ෂණ වාර්තා, තොග ලේඛන සහ ශේෂ සනාථ කිරීම් ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.2,377,155 ක් වූ ගිණුම් විෂයයන් 06 ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය. | අදාල සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | ඉදිරියේදී ලබාදීමට කටයුතු කරමි. |

## 1.4 අනුකූල නොවීම

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා | ප්‍රාදේශීය සභාවල කටයුතු පහසු කිරීමේ අදහසින් ස්ථාවර | වෙන්වෙන් වශයෙන් | ප්‍රාදේශීය සභාවට කාර්යාල කටයුතු |

| | | | | |
|---|---|---|---|---|
| | පනතේ 12(1) සහ (2) වගන්තිය සහ පළාත් පාලන නිවාස සහ ඉදිකිරීම් අමාත්‍යාංශයේ 1988 ජනවාරි 13 වන දිනැති අංක 488/16 දරන ගැසට් නිවේදනයේ 31(1) උප වගන්තිය | තීරණ ලබාගැනීම සඳහා සභාවේ ප්‍රතිපත්ති සැලසුම් කිරීමේ, නිවාස ඉදිකිරීම සමාජ සංවර්ධන, තාක්ෂණ සේවා, පරිසර හා පොදු පහසුකම් යන කරුණු සඳහා වෙන්වෙන් වශයෙන් කමිටු පිහිටුවිය යුතුවූවද එම කමිටු පිහිටුවීමට කටයුතු කර නොතිබුණි. | කමිටු පත්කර ක්‍රියා කිරීමට කටයුතු කළ යුතු වේ. | පහසුකිරීම සඳහා කමිටු පිහිටුවීමට 2019.06.04 දින සභා තීරණයක් ගෙන ඇති බව දන්වා සිටිමි. |
| (ආ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 193 වගන්තිය | අයවැය සමඟ අය සහ වැය විෂයයන් සඳහා අතිරික්ත හා ඌනතා වලට හේතු දැක්වෙන ප්‍රකාශනයක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | අදාල කාලයතුල ප්‍රකාශන පිළියෙල කර විගණනයට ඉදිරිපත් කළ යුතු වේ. | 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ සැසඳුම් ප්‍රකාශ එවන බව දන්වා සිටිමි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි<br>----------------- | | | |
| (i) | මු.රෙ. 260 සහ 389 | 2018 පෙබරවාරි අප්‍රේල් සහ ජුනි මාසවල නිකුත්කරන ලද චෙක්පත් 93 ක් තැන්පත් නිකුත් කිරීමේ ලේඛනයේ චෙක්පත් ලබාගන්නා ලද අය තහවුරු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතු වේ. | අදාල පුද්ගලයන්ගෙන් අත්සන චවුචරයේ ලබා ගන්නා අතර, චෙක්පත් නිලධාරින් රැගෙන ගොස් භාරදෙන හේතුවෙන් නිකුත් කිරීම් ලේඛන අත්සන් කිරීම් සිදු කරනු නොලැබේ. තවද, ලබා ගත බවට සනාථ කිරීම් ලබා ගන්නා බව දන්වා සිටිමි. |
| (ඈ) | 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/2 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක උපාංග හා මෘදුකාංග සම්බන්ධයෙන් වෙනම ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. | අදාල භාණ්ඩාගාර චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතු වේ. | පරිගණක උපාංග හා මෘදුකාංග තොග පොතේ සටහන් කරනු ලැබේ. ඉදිරියේදී වෙනම ලේඛනයක් පවත්වාගෙන යාමට කටයුතු කරමි. |
| (ඉ) | 1990 ඔක්තෝබර් 10 වන දිනැති අංක 41/90 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | ඉන්ධන පරික්ෂාව මාස 06 කට වරක් හෝ පැවැත්විය යුතු වුවද, 2017 ජූලි 21 දිනෙන් පසු එවැනි පරික්ෂණයක් පවත්වා නොතිබුණි. | අදාල භාණ්ඩාගාම චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතු වේ. | ඉදිරි කාලවලදි වාහනවල ඉන්ධන පරික්ෂණ කිරීමට කරන බව දැනුම් දෙමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

-----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

-----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.10,070,458 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.7,585,750 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 733,000 | 271,375 | 271,375 | - | 533,000 | 525,135 | 525,135 | - |
| කුලී | 1,950,000 | 1,902,253 | 1,902,254 | 273,000 | 1,700,400 | 1,940,615 | 1,941,000 | 273,300 |
| බලපත්‍ර ගාස්තු | 2,105,000 | 748,000 | 748,000 | - | 1,705,000 | 1,070,940 | 1,071,940 | - |
| වෙනත් ආදායම් | 26,562,000 | 27,008,322 | 16,530,970 | 7,258,104 | 21,195,000 | 18,805,064 | 15,382,000 | 6,292,761 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දින දක්වා සභාව විසින් අයකළයුතු ආදායම් රු. 36,496,011 කින් සමාලෝචිත වර්ෂයේදී රු. 19,452,599 ක් අයකර ගෙන තිබුණි. මේ අනුව ආදායම් රැස්කිරීමට ප්‍රගතිය සියයට 53% ක් විය. | ආදායම් පරික්ෂකවරු පත්කර ඉකුත් වර්ෂවල හිඟ මුදල සමඟ සමාලෝචිත වර්ෂය ආදායම් අයකර ගත යුතු වේ. | සභාවට ආදායම් පරික්ෂකවරුන් 2 දෙනෙකුගේ බඳවා ගැනීම අනුමැතිය ලැබී තිබුණද, තනතුරු හිස්ව තිබුණු හෙයින් අදාල ආදායම් අයකිරීමට නොහැකි විය. |

### 2.2.3 බලපත්‍ර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වගන්තිය අනුව වෙළඳ ආයතන 352 කින් බලපත්‍ර ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ආදායම් පරීක්ෂකවරුන් පත්කිරීමට කටයුතු කර ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | සභාවට ආදායම් පරීක්ෂකවරුන් 2 දෙනෙකු බඳවා ගැනීමට අනුමත කර තිබුණද, එම තනතුරු හිස්ව තිබීමෙන් වෙළඳ බලපත්‍ර ගාස්තු අයකර ගැනීමට නොහැකිව ඇත. කඩ වලට බලපත්‍ර ලබා ගන්නා ලෙස දැනුම් දී ඇතත් ලබා ගෙන නැත. |

### 2.2.4 කඩ කුලී

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2017 දෙසැම්බර් 31 දිනට මස්කඩ බදු කුලිය රු. 273,300 ක් වර්ෂ පහක සිට අයකිරීමකින් තොරව හිඟව තිබුණි. | බදු කුලිය අයකිරීමට කටයුතු කළ යුතු වේ. | මස්කඩ අයිතිකරුන්ට දැනුම්දී ඇත. ඔහු රටෙන් බැහැරව සිටින බැවින් ඔහුට එරෙහිව නීතියානුකුලව කටයුතු කිරීමට නොහැකිව ඇතිබව දන්වා සිටිමි. |

### 2.2.5 උසාවි දඩ මුදල් සහ මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) 2018 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ රු. 4,337,938 ක් සහ | අදාල ආදායම් අයකිරීමට කටයුතු කළ යුතු වේ. | උසාවි දඩ මුදල් 2018 වර්ෂයේදී අපවෙත ලැබී නොතිබුණි. තවද, |

| | | | |
|---|---|---|---|
| | මුද්දර ගාස්තු රු. 10,959,487 ක් ලැබිය යුතුව ඇත. | | මුද්දර ගාස්තු ලබාගැනීම සඳහා පළාත් භාණ්ඩාගාර වෙත අයදුම්කර ඇත. |
| (ආ) | නැගෙනහිර පළාත් ආදායම් දෙපාර්තමේන්තුව විසින් සෘජුව සහ ජංගම සේවාව මගින් අයකළ අතිරේක මුද්දර ගාස්තු ප්‍රාදේශීය සභාව විසින් ගණනය කර අදාල කාලයතුල අයකිරීමට කටයුතු කර නොතිබුණි. | අදාල තොරතුරු ලබා ගෙන මුද්දර ගාස්තු අයකිරීමට කටයුතු කළ යුතු වේ. | නැගෙනහිර පළාත් ආදායම් දෙපාර්තමේන්තුව විසින් සෘජුව සහ ජංගම සේවය මගින් ලබාගත් තොරතුරු අපවෙත ලැබී නොතිබීමෙන් අදාල කාලවලද අයකර ගැනීමට නොහැකිවූ බව දැනුම් දෙමි. |

**2.2.6 වෙනත් ආදායම්**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී Roller හා JCB වාහන බදුදීම වෙන්වෙන් අයවිය යුතු පිළිවලින් රු. 26,000 සහ 5,250 ක් 2019 මායි 31 දිනට හිඟව තිබුණි. | හිඟ අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | ගෙවිය යුතු අයට දැනුම් දී ඇත. |
| (ආ) | JCB වාහනයේ ධාවන සටහන් නිසි පරිදි තාක්ෂණ නිලධාරි විසින් අධීක්ෂණ කර යාවත්කාලීන කර නොතිබුණි. | වාහනවල ධාවන සටහන් යාවත්කාලීන කර නොතිබුණි. | පිළිතුරු එවා නැත. |
| (ඇ) | ඝණ අපද්‍රව්‍ය ස්ථානයේ පස් පිරවීම වෙනුවෙන් කාරෙයිතිවු ප්‍රාදේශීය සභාවෙන් ලැබියයුතු රු.1,712,948 ක් වර්ෂ 2 කට වඩා වැඩි කාලයක් ගත වී තිබුණ ද අයවී නොතිබුණි. මේ සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයේ 07 වන සභා රැස්වීමේදි 2018/82 වන තීරණය අනුව අයකර ගත යුතු බවත් නැතහොත් නීතිමය කටයුතු කළයුතු බව තීරණය වුවද, 2019 මැයි 31 දක්වා ක්‍රියාමාර්ග නොගෙන හිඟව තිබුණි. | අදාල කාලවල අයකිරීමට කටයුතු කළ යුතු වේ. | පිළිතුරු එවා නැත. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුභ විවරණය, පහසුව හා සුභසාධන යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම් පිළිබඳව අනාවරණයවු කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභාව විසින් 2012 වර්ෂයේ කාරණා 07 ක් සඳහා යෝජනා පිළියෙල කර තිබු නමුත් එය අනුමත කර ක්‍රියාත්මක කිරීම සඳහා කටයුතු කර නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා සඳහා අනුමැති ලබා ගැනීම කටයුතු කළ යුතු වේ. තවද සභාවට උචිත අනෙකුත් කරුණු සම්බන්ධයෙන්ද අතුරු ව්‍යවස්ථා පැනවීමට කටයුතු කළ යුතු වේ. | අදාල අතුරු ව්‍යවස්ථා 07 අනුමැතිය සඳහා අදාල කාලයතුල පළාත් සභාවට යවා තිබුණද, දැනට නැගෙනහිර පළාත් සභාව වෙත අතුරු ව්‍යවස්ථා 05 ක් පරික්ෂා කර ලියවිලි පිළියෙල කර 2019.05.23 වන දින 2019/219 දිනට සභා තිරණය සමග පළාත් සභා වෙත යවා ඇත. මෙය ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සමග ගැසට් කිරීමට කටයුතු කරන බව දැනුම් දෙමි. |

(ආ) ක්‍රියාකාරි සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අනුමැතිය ලබා ගැනීම සඳහා සකස්කරන ලද අතුරු ව්‍යවස්ථා අනුව සභාව විසින් ක්‍රියාත්මක කළයුතුව තිබු ප්‍රධාන කාරණා සම්බන්ධයෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලස්මක් පිළියෙලකර නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා අනුව ක්‍රියාත්මක කළයුතු ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් වාර්ෂික ක්‍රියාකාර සැලැස්මක් පිළියෙල කළ යුතු වේ. | ඉහත අතුරු ව්‍යවස්ථා නැගෙනහිර පළාත් සභාව විසින් අනුමත කිරීමෙන් පසු ඉදිරියේදි ක්‍රියාකාරි සැලැස්ම පිළියෙල කිරීමට කටයුතු කරමි. |

(ඇ) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2017 ජුලි 08 දින කළමනාකරණ කමිටු රුස්වීම අනුව සභා බලප්‍රදේශයේ ඝණ අපද්‍රව්‍ය වර්ගීකරණය කිරීම සඳහා රු. 216,000 ක් මුදලට බෑග් 8000 (Bags) 2017 වර්ෂයේදී මිලදි ගෙන තිබුණු අතර, අද දක්වා බෑග් 1,028 ක් පමණක් නිකුත්කර බෑග් 6972 ක ගබඩාවේ නිෂ්ක්‍රියව තිබුණි. | නිසි අධ්‍යානයකින් පසු අවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගත යුතු වේ. | ඝණ අපද්‍රව්‍ය වර්ගීකරණය කර එකතු කිරීමේ කටයුතු සම්බන්ධයෙන් මහ ජනතාව දැනුවත් කර වර්ගීකරණය කරන ලද කසළ රැස්කරන ලදි. එසේ වෙන් කරන ලද කසළ රැස්කර ස්ථානයට එකතුවීම නිසා මහජනතාවට මේ ක්‍රමයෙන් සිදු වූ අපහසුතාවය මඟ හැරීම සඳහා තාවකාලිනව වර්ගීකරණය කිරීම නවත්වන ලදී. කසළ වර්ගීකරණය කර ලබා ගැනීමේ ක්‍රියාවලිය ආරම්භ කිරීමෙන් පසු මහජනතාව |

| | | |
|---|---|---|
| | | බැග් බෙදාහැරීමට කටයුතු කරන බව දන්වමි. |

(ඇ) තිරිසාර සංවර්ධන ඉලක්ක

--------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2017 අංක 19 දරන ශ්‍රී ලංකා තිරසර සංවර්ධන පනත අනුව 2030 වර්ෂයේ එක්සත් ජාතින්ගේ න්‍යාය පත්‍රයට අනුකූල වන පරිදි සෑම පොදු ආයතනයම ක්‍රියා කළයුතුයි. එසේ වුවත් මේ සම්බන්ධ ඉලක්ක හඳුනාගෙන එය ලඟා කරගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉලක්ක හඳුනාගෙන ඒවා මැණීම සඳහා දර්ශක හඳුනාගෙන ලඟා කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉලක්ක ලගා කර ගැනීම සඳහා තිරසාර සංවර්ධන වැඩසටහන් දැනට හඳුනාගෙන යනු ලැබේ. මෙය නිමවූ පසු සභාවේ අනුමැතිය ලබා ගෙන අනාගතයේදි කඩිනමින් මෙම ඉලක්ක ලඟා කර ගැනීම සඳහා කටයුතු කරන බව දැනුම් දෙමි. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

------------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ඉඩම් 26 ක අයිතිය සභාවේ නමට මාරු කර ගැනීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි. | සභාවසතු ඉඩම් රජයේ ඉඩම් ආඥා පනත යටතේ පවරා ගැනීමට කටයුතු කළ යුතු වේ. | මෙතෙක් හඳුනාගත් සභාවේ නමට අයිතිය පවරා නොගත් ඉඩම් 26 ක අයිතිය සභාවේ නමට පවරා ගැනීමට කඩිනමින් කටයුතු කරමි. |
| (ආ) | 1958 අංක 16 දරන සේවක අර්ථසාධක අරමුදල් (EPF) සහ 1980 අංක 46 දරන සේවක භාරකාර අරමුදල පනත අනුව අරමුදල සඳහා දායක මුදල මාසික දළ වැටුප් අනුව ගණනය කළයුතු වුවද, සමාලොචිත වර්ෂයේ EPF සහ ETF සඳහා දායක මුදල මූලික වැටුපට ගණනය කර අරමුදල් වලට යවා තිබුණි. | පනත අදාල කටයුතු කළ යුතු වේ. | තාවකාලික සේවකයන්ගේ EPF සහ ETF දායක මුදල මූලික වැටුප අනුව ගණන කර යවනු ලැබේ. ඉදිරි මාසයේ සිට EPF සහ ETF දායක මුදල දළ වැටුප අනුව ගණනය කර යැවීමට කටයුතු කරමි. |
| (ඇ) | 2012 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලවල නිර්දේශ අනුව භාණ්ඩ වර්ග 35 ක අයිතම් 238 ක ඌනතාවයක් තිබුණද, මේ සම්බන්ධයෙන් 2018 සැප්තැම්බර් 17 දින දක්වා සභාව විසින් කටයුතු කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් අවශ්‍ය තීරණය ගැනීමෙන් පසු පළාත් පාලන සහකාර කොමසාරිස්, පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතිය ලබාගෙන ඒ අනුව කටයුතු කළ යුතු වේ. | 2012 වර්ෂය පෙර කාලවලදී සිදුවී ඇත. එවකට සිටි සභාපතිතුමා මිය ගොස් ඇති බැවින්, මෙය කපා හැරීමට අවශ්‍ය ක්‍රියා මාර්ග සභාව විසින් ගනු ලබන බව දන්වා සිටිමි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | වෙනත් ආයතනවලින් ලබාගත්, සභාව විසින් ප්‍රයෝජනයට ගනු ලබන වාහන 2 ක අයිතිය සභාවේ නමට මාරුකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි. | වාහනවල අයිතය සභාව නමට මාරු කර ගැනීම සඳහා කටයුතු කළ යුතු වේ. | අදාල වාහනයේ අයිතිය මාරුකර ගැනීම සඳහා කටයුතු කරමි. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

-----------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ---------------------- | ----------- | ---------------- |
| (අ) | සමාලෝචිත වර්ෂයේ පැවති තනතුරු 7 ක පුරප්පාඩු 8 ක් පිරවීම සඳහා කටයුතු කර නොතිබුණි. | සභාවේ තනතුරුවල පුරප්පාඩු පිරවීම සඳහා කටයුතු කළ යුතු වේ. | කාර්ය මණ්ඩල පිළබඳ මාසික වාර්තාව නැගෙනහිර පළාත් සභා වෙත යවනු ලැබේ. මේ සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු නැගෙනහිර පළාත් සභාව විසින් ගනු ලබන බව දන්වමි. |
| (ආ) | සභාවේ ලේකම් තනතුර 2017 වර්ෂයේ සිට පුරප්පාඩුව පැවතුණි. | සභාවේ ප්‍රධාන තනතුරුවල පුරප්පාඩු පිරවීම සඳහා කටයුතු කළ යුතු වේ. | කාර්ය මණ්ඩල පිළිබඳ මාසික වාර්තාව නැගෙනහිර පළාත් සභාව වෙත යවනු ලැබේ. මේ සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු නැගෙනහිර පළාත් සභාව විසින් ගනු ලබන බව දන්වමි. |
| (ඇ) | 2015 වර්ෂය සිට සමාලෝචිත කාලය දක්වා හිඟව තිබූ නිලධාරීන් 07 දෙනෙකුගෙන් අයවිය යුතු රු. 169,135 ණය ශේෂය සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ ණය මුදල අදාල අයගෙන් හෝ ඇපකරුගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | දැනට සේවයේ නියුතු නිලධාරීනගේ ණය ශේෂ අදාල දෙපාර්තමේන්තුවලින් අයකර ගැනීමට කටයුතු කරමි. |

**3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

-----------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ---------------------- | ----------- | ------------------------------- |
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154 වගන්තිය අනුව ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ තිබෙන වෙළඳ සැල්වලින් සහ නිවාසවලින් වරිපනම් බදු සමීක්ෂණය කර අයකර ගැනීමට කටයුතු නොකිරීම නිසා වාර්ෂිකව රු. 2,500,000 ක පමණ ආදායමක් අහිමි වී තිබුණි. | වරිපනම් බදු අයකිරීම් කටයුතු කළ යුතු වේ. | මේ සම්බන්ධයෙන් සභා තීරණ ලබාගෙන අවශ්‍ය කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සභා විසින් ආදායම් අයකිරීමට අදාල අතුරු ව්‍යවස්ථා පනවා නොතිබීමෙන් සභා බලප්‍රදේශයේ පුද්ගලික ආයතනවලින් තම වෙළඳ භාණ්ඩ විකුණා ගැනීම සඳහා අමතරව ඉදිකර තිබුණු දැන්වීම් පුවරු සඳහා බලපත්‍ර ගාස්තු අයකර ගැනීමට නොහැකිවීමෙන් වාර්ෂිකව රු. 120,000 ක ආදායමක් අහිමිවී ඇත. | ප්‍රචාරක දැන්වීම් පුවරු වලට අනුව අතුරු ව්‍යවස්ථා අනුව දැන්වීම් පුවරු ගාස්තු අයකිරීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී සම්පූර්ණයෙන් මේ මුදල අයකිරීමට අවශ්‍ය කටයුතු කරමි. |

**3.5 වත්කම් කළමනාකරණය**

-----------------------------

**3.5.1 වත්කම් ලේඛන ගත නොකිරීම**

-----------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ---------------------- | ----------- | ------------------------------ |
| සභාවට අයත් ඉඩම් හා ගොඩනැගිලිවල එකතු වටිනාකම රු. 136,044,854 ක් ලෙස ගිණුම්වල දක්වා තිබුණද, චලනයවන සහ චලනය නොවන වත්කම් ස්ථාවර වත්කම් ලේඛනයේ සටහන් කිරීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි.ෙ | ස්ථාවර වත්කම් ලේඛනය නිසි පරිදි යාවත්කාලීන කළ යුතු වේ. | අදාල ලේඛනවල චලනය වන සහ චලනය නොවන වත්කම් සටහන් කිරීමට කටයුතු කර ඇති බව කාරුණිකව දන්වමි. |

**3.5.2 නඩත්තු හා අළුත්වැඩියා සිදු නොකිරීම**

-------------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ---------------------- | ----------- | ---------------------------- |
| සභාව සතු ට්‍රැක්ටර් රථ 01, වතුරු බව්සර 03 , Single Drum Vibrator යනාදීය වසර කීපයක සිට අළුත්වැඩියාවකින් තොරව නිෂ්ක්‍රීයව පැවතුණි. | වාහන අපහරණය කිරීමට හො අළුත්වැඩියා කිරීමට කටයුතු කළ යුතු වේ. | සභාව සතු ට්‍රැක්ටර් රථ 01, වතුරු බවුසර 03 , Single Drum Vibrator 01 සම්පූර්ණයෙන් අක්‍රිය තත්වයේ ඇති බැවින් මේවා නැගෙනහිර පළාත් නියෝජ ප්‍රධාන ලේකම් (Engineer) වෙත දන්වා වාර්තා ලබාගෙන යන්ත්‍ර අළුත්වැඩියා කිරීමට හෝ විකිණීමට කටයුතු කරමින් පවතින බව දන්වා සිටිමි. |

**3.5.3 නිෂ්ක්‍රිය / ඌන උපයෝජිත වත්කම්**

---------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ---------------------- | ----------- | ---------------------------- |
| 2014 වර්ෂයේ පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදානය යටතේ ලබා දී තිබු රු. 1,400,000 ක් යොදවා පල්ලක්කාඩු ග්‍රාමයේ ඉදිකර තිබු සත්ව කටු ඇඹරුම් මධ්‍යස්ථානය සහ ඒ සඳහා මිලදී ගෙන තිබු යන්ත්‍ර ප්‍රයෝජනයට ගැනීමට කටයුතු නොකර නිෂ්ක්‍රිය තිබුණි. | කටු ඇරඹුම් යන්ත්‍රය ක්‍රියාත්මක කර සභාවට ආදායම් ඉපයීමට කටයුතු කළ යුතු වේ. | සණ අප ද්‍රව්‍ය මධ්‍යස්ථානයේ කටු ඇඹරුම් යන්ත්‍රය ක්‍රියා කිරීම සඳහ 3 Phase line විදුලිය අවශ්‍ය වූ හෙයින් යන්ත්‍ර ක්‍රියා නොකර තිබුණි. දැනට මෙම විදුලි සම්බන්ධතාව ලබා ගෙන ඇති බැවින් හැකි ඉක්මනින් මෙය |

ක්‍රියාත්මක කිරීමට කටයුතු කර ඇති බව දන්වා සිටිමි.

**3.6 ප්‍රසම්පාදන**

**ප්‍රසම්පාදන සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | ප්‍රසම්පාදන සැලස්මක් පිළියෙල කළ යුතු වේ. | ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කිරීමට අවශ්‍ය කටයුතු කරන බව දන්වනු කැමැත්තෙමි. |

**4 ගිණුම් කටයුතු භාවය සහ යහපාලන**

**නිරවුල් නොවූ නිරීක්ෂණ**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | 2005 වර්ෂයේ නැතිවූ රු. 96,392 ක් වටිනා විදුලි උපකරණ සහ 2014 වර්ෂය රු. 170,000 ක් මිලදි ගෙන පාලමුණේ - ඔලුවිල් ප්‍රධාන මාර්ගයේදි සවිකර තිබූ හිරු එලියෙන් ක්‍රියාත්මක වන විදුලි බුබුලු 02 ක් සහ සවිකිරීම 2015 දෙසැම්බර් 20 වන දින සොරකම් කිරීම සම්බන්ධයෙන් 2018 සැප්තැම්බර් 17 දින දක්වා මුදල් රෙගුලාසි 104 අනුව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 104 අනුව අදාල කාලයේදි කටයුතු කළ යුතු වේ. | 2005 වර්ෂයේ සිට ගබඩා ලේඛනය රු. 96,392 වටිනා විදුලි භාණ්ඩ දිගටම පෙන්වා ඇත. කෙසේවූවද, එයට අදාල ලියවිලි කිසිවක් නොතිබුණි. තවද, 2014 වර්ෂයේ අඩ්ඩාලචේනයි, මීනෝඩයි කට්ටු, පාලමුණේ ගම්වලට සභාව විසින් මිලදි ගෙන සවිකර තිබූ හිරු එලියෙන් ක්‍රියාකරන විදුලි බුබුලු 02 ක් සොරකම් කිරීම සම්බන්ධයෙන් පොලිසියේ පැමිණිලි කර ඇත. |